# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2008 අංක 37 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ඔක්තෝබර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2008 අංක 37 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 63/2007.

ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්ත කර සිට පසුව නිවාස සංවර්ධන අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරන ලද නිලධාරීන්ට සහ සේවකයන්ට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබීමට හැකිවනු පිණිස විශේෂ විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 37 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1979 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුවම වූ දිනයේ දී ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්ත කර සිට පසුව (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සේවයේ නියුක්ත කරන ලද (ස්ථාන මාරුවීම් සහිත සේවයක සිටි නිලධරයකු හෝ සේවකයකු නොවන) සෑම නිලධරයකුම සහ සේවකයකු ම ඔහු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කර සිටියේ වුව ද, අධිකාරිය විසින් ඔහු සේවයේ නියුක්ත කරන ලද දිනයේ සිට එම අධිකාරියේ ඔහුගේ සේවා කාලය අවසානය දක්වා ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු වශයෙන් ධුරය දිගටම දැරූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුගේ අධිකාරියේ සේවා කාලය ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ වූ සේවා කාලයට එකතු කළ විට, අවුරුදු දහයකට හෝ ඊට වැඩි වන්නේ නම්, ඔහුගේ අධිකාරියේ වූ සේවා කාලය අවසානයේ දී, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ වූ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීමට ඔහු සුදුස්සකු විය යුතු ය.

ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිට පසුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සේවයෙහි යොදවන ලද නිලධරයන්ට හා සේවකයන්ට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.

3. (1) 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබීමට සුදුස්සකු බවට පත්වන සෑම තැනැත්තකුම අධිකාරියෙහි ස්ථිර සේවා නියුක්තිය ඔහු විසින් භාර ගැනීම මත විශ්‍රාම වැටුප වෙනුවට ඔහුට ගෙවා ඇති යම් පාරිතෝෂික ගෙවීමක් ඔහු විසින් හෝ ඔහුගේ උරුමක්කාරයන් විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු ආපසු ගෙවීමකට යටත්ව, ඒ විශ්‍රාම වැටුප ලැබිය යුතු ය.

ප්‍රදානය කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි.

2—PL 002932—3,500 (2008/04)

(2) 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම සඳහා සුදුස්සකු බවට පත්වන සෑම තැනැත්තකුම—

(අ) තමා වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට බැර කරන ලද සේවා යෝජකයාගේ දායක මුදල ආපසු ගෙවීමකට යටත්ව; සහ

(ආ) සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට තමා වෙනුවෙන් බැරකරන ලද මුළු දායක මුදල ආපසු ගෙවීමකට යටත්ව,

ඒ විශ්‍රාම වැටුප ලැබිය යුතු ය.

(3) (2) වන උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ අයකර ගන්නා ලද මුදල් අධිකාරියේ ආදායමට බැර කල යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

''සේවක අර්ථසාධක අරමුදල'' යන්නෙන්, 1958 අංක 15 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදල අදහස් වේ;

''සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල'' යන්නෙන්, 1980 අංක 46 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල අදහස් වේ;

''පාරිතෝෂික ගෙවීමක්'' යන්නෙන්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගණනය කරනු ලැබූ පාරිතෝෂික ගෙවීමක් අදහස් වේ; සහ

''ජාතික නිවාස සංවර්ධන අධිකාරිය'' යන්නෙන්, 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.